KIDS GOD WORSHIP
www.kidworship.kr

# මෝසෙස් 2

- 15th Story-



102Page

පොතේ ගුරා
මෝසෙස් ශක්තිමත්, දැනුම ඇති, ශෝභමාන තරුණයෙක් හැටියට ඊජිප්තු රජමාලිගාවේ වැඩී වර්ධනය වුණා. නමුත් ඉශ්රායෙල්වරුන් තවමත් වහල්ලු ලෙස ඊජිප්තුවේ දුක් විඳින බව මෝසෙස්ට අමතක වුණේ නෑ. දවසක් ඊජිප්තුවරුන් වැඩ කරගෙන සිටිය දී මෝසෙස් ඇවිදගෙන ගියා. මේ වෙලාවේ ඊජිප්තු මිනිසෙක්, හෙබ්‍රෙව් මිනිසෙකුට පහර දෙනවා මෝසෙස් දුටුවා.

ඊජිප්තු මිනිසා
( පහර දෙන ශබ්දය ) දැන් නැගිටපන්.
උඹට තව ගොඩාක් දේවල් කරන්න තියෙනවා.

හෙබ්‍රෙව් මිනිසා
ඌයි.. හායි... අම්මෝ....

පොතේ ගුරා
ඊජිප්තු මිනිසා හෙබ්‍රෙව් මිනිසාට පහර දෙන ආකාරය මෝසෙස් දුටුවාම තමන්ගේ ජාතිය ගැන කැක්කුමක් තිබූ මෝසෙස්ට හොඳටම තරහ ගියා. ඒ නිසා ඔහු මිසරයා මරා වැල්ලේ සැඟෙව්වා.
මෝසෙස් ඊජිප්තු මිනිසාව මැරීම පිළිබඳ ආරංචිය රජමාලිගාව පුරා පැතිර ගියා. ඵාරාවෝ රජු මෙය දැනගත් පසු මෝසෙස්ව මරන්නට සෙව්වා. රජුට බය වූ මෝසෙස් මිදියන් දේශයට පලා ගියා.

.......................................................................................



103Page

පොතේ ගුරා
මිදියන් දේශයට පලා ගිය මෝසෙස් එඬේරෙක් ලෙස එහි ජීවත් වුණා. ඉශ්රායෙල්වරුන් වහලුන් සේ දුක් විඳින ජීවිතයත්, තමුන් මිසරයේ කුමාරයෙක් සේ ගත කළ ජීවිතයත් ඔහු ක්‍රමයෙන් අමතක කරන්න පටන්ගත්තා. එක දවසක් මෝසෙස් බැටළු රැළ බලා ගන්න පිණිස හොරෙබ් කන්දට ගියා. මෙහිදී මෝසෙස් හරි අමුතු දෙයක් දුටුවා.

මෝසෙස්
හ්...හ්... අර පඳුර ගිනි ඇවිලෙනවා. ඒත් ඒක පිච්චිලා යන්නේ නෑනේ. කොහොමද මේක වෙන්න පුලුවන් ?

පොතේ ගුරා
එවිට පඳුර මධ්‍යයෙන් දෙවියන්වහන්සේගේ හඬ ඇසුණා.

දෙවියන්වහන්සේ
මෝසෙස් ! මෝසෙස් !

මෝසෙස්
ඕහ්... ඔබ කවුද ?

දෙවියන්වහන්සේ
මෝසෙස්, මම ඔබේ පියවූ ආබ්‍රහම්ගේ ද, ඊසාක්ගේ ද, යාකොබ්ගේ ද දෙවි වූ ස්වාමින්වහන්සේය.

පොතේ ගුරා
මේ වචන ඇසුණු මෝසෙස්, දෙවියන්වහන්සේ දෙස බලන්නට තිබූ බය නිසා ඔහුගේ මුහුණ සඟවා ගත්තා.

දෙවියන්වහන්සේ
මෝසෙස්, මිසරයේ වසන මාගේ සෙනඟගේ පීඩාව සැබවින්ම මම දුටිමි. ඔවුන්ගේ විධානවරුන් නිසා ඇති ඔවුන්ගේ මොරගැසීම මම ඇසීමි. ඔවුන්ගේ දුක් දනිමි. මාගේ සෙනඟ වූ ඉශ්රායෙල් මිසරයෙන් මුදවා ගන්න පිණිස මම ඔබව ඵාරාවෝ වෙතට යවමි.

පොතේ ගුරා
මේ වෙලාවේ මෝසෙස් ගොඩාක් බය වුණා.

මෝසෙස්
ඒත් ස්වාමිනි ! ඵාරාවො ළඟට යන්න තරම් මම කවුද?
ඉශ්රායෙල්වරුන් ඊජිප්තුවෙන් ගළවා ගන්න මම කවුද? මම කවදාවත් දක්ෂ කතාකාරයෙක් නොවෙයි. මම කතා කරන්න දන්නෙම නැති කෙනෙක්.

දෙවියන්වහන්සේ
බය වෙන්න එපා. මම ඔබ සමඟ සිටිමි. මම ඔබගේ සහෝදර වූ ආරොන් ඔබ සමඟ එවමි. මම ඔබට කතා කරන්න උදවු කරන්නම්. ඔබ කළ යුතු දේ කුමක් ද කියා මම ඔබට උගන්වන්නම්.



104Page

| | |
|---|---|
| පොතේ ගුරා | මෝසෙස් ආරොන් සමඟ ඊජිප්තුවේ ඵාරාවෝ ඉදිරියට ගියා. |
| මෝසෙස් | ඉශ්රායෙල් සෙනඟ නිදහස් කරන්න. කාන්තාරයේ දී දෙවියන්වහන්සේට නමස්කාර කරන්න ඔවුන්ව පිටත් කරන්න. |
| ඵාරාවෝ | මොකක්...! කවුද උඹේ දෙවියන්වහන්සේ ? මට එයා කවුද ? මම ඒ දෙවියන්වහන්සේ දන්නෙ නෑ. මම ඉශ්රායෙල්වරු දෙන්නෙත් නෑ. කවදාවත්ම දෙන්නේ නෑ. |
| පොතේ ගුරා | ඉශ්රායෙල් සෙනඟ සදාකාලික වහල්ලු විදිහට තබා ගැනීමට ඵාරාවෝට තිබූ අදහස නිසා ඔහු සෙනඟ නිදහස් කළේ නෑ. මෝසෙස් කිවූ දේවල් ඵාරාවො රජු විශ්වාස නොකළ නිසා, මෝසෙස් තමුන්ගේ සැරයැටිය ආරොනට දී එය විසි කරන ලෙස කීවා. එවිට එකවරම සැරයැටිය සර්පයෙක් වුණා. ඒ මොනවා වුණත් ඵාරාවො මෝසෙස් සහ ආරොන්ට සවන් දුන්නේ නෑ. මේ වෙනුවට ඵාරාවෝ වඩ වඩා ඉශ්රායෙල්වරුන්ට වද දෙන්න පටන් ගත්තා. |

.........................................................................................



105Page

| | |
|---|---|
| පොතේ ගුරා | දෙවියන්වහන්සේ උදහස් වුණා. |
| දෙවියන්වහන්සේ | මෝසෙස්, ඊජිප්තුවේ තියෙන සියලුම ගංගාවන් ලේ බවට හරවන්න. |
| පොතේ ගුරා | දෙවියන්වහන්සේ කී ආකාරයෙන්ම, ඊජිප්තුවේ සියලුම ගංගාවන් ලේ බවට පත් වුණා. ඒ නිසා ඊජිප්තුවේ බීමට ජලය නැති වුණා. ඒත් ඵාරා-වො මුරණ්ඩුව සිටියා. මේ නිසා දෙවියන්වහන්සේ ඊජිප්තුවට තවත් බො-හෝ වසංගත එව්වා. ගෙම්බෝ, මැස්සෝ, ගව වසංගත, අන්ධකාරය, කිනිතුල්ලෝ, පළගැටියෝ වැනි වසංගත වලින් මිසරයට පහර දුන්නා. ඒත් ඵාරාවෝ, තවමත් ඉශ්රායෙල්වරු නිදහස් කළේ නෑ. මේ නිසා දෙවියන්වහන්සේ 10 වෙනි වසංගතය මිසරයට එව්වා. |
| දෙවියන්වහන්සේ | මෝසෙස්, මිසර සෙනගගේත්, සත්වයන්ගේත්, සියලුම කුලුදුලන්ට මම පහර දෙන්නෙමි. ඉශ්රායෙල් නිවෙස්වල උළුවහු පිට බැටළු ලේ තවරා ඇති නිවෙස් පමණක් මම ගළවන්නෙමි. |
| පොතේ ගුරා | මධ්‍යම රාත්‍රියේ දී ඊජිප්තුවේ බොහෝ හැඬීම් ඇසෙන්න පටන් ගත්තා. හේතුව එදා රාත්‍රියේ දී ඊජිප්තුවේ දී 10 වෙනි වසංගතය විදිහට සියලු කුලුදුලන් මරණයට පත් වුණා. |

.........................................................................................



107Page

| | |
|---|---|
| පොතේ ගුරා | ඵාරාවොගේ කුලුදුල් පුත්‍රයාත් මිය ගියා. අන්තිමට ඵාරාවො මෝසෙස්ට හඬ ගසා මෙසේ කීවා. |
| ඵාරාවෝ | නැගිටින්න. මේ සෙනඟ අරගෙන ඔබත් ඉශ්රායෙල්වරුනුත් මෙහෙන් පිටත් වෙන්න. ඔබ ඉල්ලුවා වගේම ගොස් ඔබේ දෙවියන්වහන්සේට නමස්කාර කරන්න. ඔයාලට අයිති දේවලුත් සත්වයනුත් අරන් යන්න. |
| පොතේ ගුරා | මේ හේතුවෙන්, අවුරුදු 400 කට පසුව, ඉශ්රායෙල් සෙනඟට මෝසෙස් සමඟ ඊජිප්තුවෙන් පිටත් වෙන්නට පුලුවන් වුණා. |

.........................................................................................

| | |
|---|---|
| ජිවිතයට අදාල කිරීම | දුවේ පුතේ, දෙවියන්වහන්සේ පුංචි මෝසෙස් තෝරාගත්තා වගේ පුංචි ඔයාවත් ලොකු වැඩවලට තෝරගෙන තිබෙනවා. උන්වහන්සේ ඔයාව තෝරාගත්තේ මොනවගේ දේවල් කරන්නද කියා අසා දැනගන්න ආසයි නම් ඒ ගැන යාච්ඤා කරන්න පටන් ගන්න. |